ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
கிறிஸ்தவ மத அலுவல்கள் திணைக்களம்
**Department of Christian Religious Affairs**

බයිබල් දැනුම මිනුම ලිඛිත විභාගය 2024 | 10 ,11
திருவிவிலிய அறிவுப் போட்டி 2024 | 10 ,11
Bible Quiz Written Examination 2024 | 10 ,11

පැය දෙකයි
நேரம் 2
Two hours

**සියළුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**/ சகல வினாக்களுக்குமான விடைகளை இந்த வினாத்தாளிலேயே விடையளிக்கவும் / Answer all the questions in the space provided

විභාග අංකය
பரீட்சை எண்
Index No

..............................................
ශාලා නිරීක්ෂකගේ අත්සන /
மண்டப மேற்பார்வையாளரின் கையொப்பம்.
/ Signature of the Invigilator

උපදෙස් / அறிவுறுத்தல்கள்/ Instructions

- මෙම පිටුවෙත් සියලුම පිටුවලත් ඔබගේ විභාග අංකය නිවැරදිව ලියන්න / இந்த பக்கத்திலும் சகல பக்கங்களிலும் உங்கள் பரீட்சை எண்ணை சரியாக எழுதவும். / Write your Index number correctly on this page and on all pages
- 01 සිට 05 වඩාත් සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න. / 01 முதல் 05 வரை பொருத்தமான விடையின் கீழ் கோடிட்டுக் காட்டுக. / Underline the most appropriate answer to question 01 to 05
- 06 සිට 40 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න. / 06 முதல் 40 வரையான வினாக்களுக்கு சரியான விடை அளிக்கவும் / Give correct answers to question 06 to 40
- 41 සිට 50 දක්වා සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න. / 41 முதல் 50 வரை பொருத்தமான வார்த்தையை வைத்து இடைவெளியை நிரப்புக. / Fill in the blanks from 41 to 50 using the appropriate word

**For Examiner's use only**

| Page | Marks |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| **TOTAL** | |

Examined by:

Checked by :

Index Number ………………………………………… Marks

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. වංචාවෙන් ලබා ගත් වස්තුව හොර තරාදි හා බොරු පඩි ඇත්තේ කාගේ නිවෙස් වලද?

1. හොරුන්ගේ 2. දුදනන්ගේ

3. වංචාකාරයන්ගේ 4. බොරුකාරයන්ගේ

2. මීකා දිවැසිවරයාගේ පොතේ 6 වන පරිච්ඡේදයේ, සමිඳාණන් වහන්සේ ඉශ්‍රායෙල්ට විරුද්ධව කරන චෝදනාවට සවන් දෙන්නැ'යි කියන්නේ කාහටද?

1. ගංගාවලට 2. මහ මුහුදට

3. කඳු වලට 4. අහසට

3. **"රබ්බි"** යන වචනයේ තේරුම කුමක්ද?

1. ගුරු දේවයනි යනුයි 2. මාගේ ස්වාමිනී යනුයි

3. මාගේ දෙවියනි යනුයි 4. මාගේ ගැලවුම්කරු යනුයි

4. පව්කාර ස්ත්‍රියට ගල් ගසා මරා දමන්නට විනයධරයන් හා පරිසිවරුන් සූදානම් වුයේ කාගේ ව්‍යවස්ථාව අනුවද?

1. මීකාගේ 2. බෙන්ජමින්ගේ

3. එලියස්ගේ 4. මෝසෙස්ගේ

5. ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤාව අවසන් කර සිය ශ්‍රාවකයන් සමඟ කුමන ඇලෙන් එගොඩට වැඩිය සේක්ද?

1. හෙබ්‍රොන් ඇලෙන් 2. කිද්‍රොන් ඇලෙන්

3. ගලීල ඇලෙන් 4. සමාරිය ඇලෙන්

Index Number ………………………………………… Marks

කෙටි පිළිතුරු සපයන්න.

6. සමිඳාණන් වහන්සේ සමාරිය හා ජෙරුසලම සම්බන්ධව දර්ශන මඟින් මෝරෙෂෙත්හි මීකාට පණිවුඩ ප්‍රකාශ කළේ කව්රුන් ජුදාහි රජකම් කරන කාලයේදීද?

……………………………………………………………………………………………………………

7. මරේෂාහි වැසියන්ගේ දරුවන්ගේ හිසකෙස් කපා, බුගා, ගිජුලිහිණියකුගේ හිස මෙන් හිස මුඩු කරගන්නැ'යි සමිඳාණන් වහන්සේ ඉල්ලන්නට හේතු වූයේ කුමක්ද?

……………………………………………………………………………………………………………

8. මීකා 3 පරිච්ඡේදයේ සඳහන් පරිදි මුදලට ජේන කියන්නේ කව්ද?

……………………………………………………………………………………………………………

9. මීකා 4 පරිච්ඡේදයේ සඳහන් පරිදි සමිඳුන්ගේ නීතිය නිකුත් වන්නේ කොහෙන්ද?

……………………………………………………………………………………………………………

10. සියොන් පුරඟන නැඟිට කුමක් කරන්නැයි; සමිඳාණන් වහන්සේ මීකා 4 පරිච්ඡේදයේ පවසන්නේද?

……………………………………………………………………………………………………………

11. සමිඳාණන් වහන්සේ සිය සෙනඟ සතුරන්ට පාවා දෙන්නේ කුමක් සිදුවන තාක් කල්ද?

……………………………………………………………………………………………………………

12 . කාගේ විශ්වාසය සමිඳාණන් වහන්සේ කෙරෙහි මිස මිනිසා කෙරෙහි නොවන්නේ යැයි, මීකා 5 පරිච්ඡේදයේ සඳහන් වන්නේ ද?

……………………………………………………………………………………………………………

13. සමිඳාණන් වහන්සේට කීකරු නොවූ ජාතීන් හට කුමක් වන්නේද?

……………………………………………………………………………………………………………

14. මීකා 6 පරිච්ඡේදයේ සඳහන් පරිදි ජනතාවට මඟ පෙන්වන පිණිස සමිඳාණන් වහන්සේ එවූ දෙදෙනෙකු නම් කරන්න

……………………………………………………………………………………………………………

15. සමිඳාණන් වහන්සේ ජනතාවගෙන් ඉල්ලා සිටින දේවල් 2ක් මීකා 6 පරිච්ඡේදයේ සඳහන් පරිදි ලියන්න

……………………………………………………………………………………………………………

Index Number …………………………………………. Marks

16. මීකා 7 පරිච්ඡේදයේ සඳහන් පරිදි මිනිසෙකුගේ සතුරන් ලෙස හඳුන්වා දී ඇත්තේ කාවද?

……………………………………………………………………………………………………………………

17. අන්ධකාරය කිසි කලක ග්‍රහණය නොකලේ කුමක්ද?

……………………………………………………………………………………………………………………

18. මාංශගතව අප සමඟ වැඩ විසූ ධර්මයාණෝ පූර්ණ වූයේ කුමකින්ද?

……………………………………………………………………………………………………………………

19. ජේසුස් වහන්සේ සීමොන් දෙස බලා “ඔබ ජොහන්ගේ පුත් සීමොන්ය; ඔබට ‘කේපස් ‘ යයි කියනු ඇතැයි” වදාළ සේක.මෙහි “කේපස් ” යන්නෙහි අර්ථය කුමක්ද?

……………………………………………………………………………………………………………………

20. ජේසුස් වහන්සේගේ ගෝලයෙකු වූ පිලිප්ගේ ගම කුමක්ද?

……………………………………………………………………………………………………………………

21. කානා නුවර මඟුල් ගෙදර දි මිදි යුෂ හිඟ වූ විට, දේව මෑණියන් විසින් “මිදි යුෂ නැතැයි”ජේසුස් වහන්සේට පැවසූ විට; ජේසුස් වහන්සේ පවසා සිටියේ කුමක්ද?

……………………………………………………………………………………………………………………

22. ජාකොබ්ගේ ළිඳ තිබුණේ කුමන නගරයේ ද?

……………………………………………………………………………………………………………………

23. ජෙරුසලමෙහි බැටළු දොරටුව ළඟ තිබූ පොකුණට හේබ්‍රෙව් බසින් කියන ලද නම කුමක්ද?

……………………………………………………………………………………………………………………

24. පන්දහසකට ආහාර ලබා දීමේ ප්‍රාතිහාර්ය සිදු කළ අවස්ථාවේ ජේසුස් වහන්සේ “මොවුන් හැම දෙනාටම කන්නට දීමට අපි කොතනින් රොටි මිලට ගනිමුද?” ඇසුවේ කාගෙන්ද?

……………………………………………………………………………………………………………………

25. “දෙවියන් වහන්සේ ගේ අභිප්‍රාය අනුව වැඩ කරන පිණිස අප කුමක් කළ යුතුද? යි ” ජනතාව ජේසුස් වහන්සේ ගෙන් ඇසූ කළ උන් වහන්සේ දුන් පිළිතුර කුමක්ද?

……………………………………………………………………………………………………………………

26. ජේසුස් වහන්සේ ජුදෙව්වරුන්ගේ කුමන මංගල්‍යයකට රහසින් වැඩිය සේක්ද?

…………………………………………………………………………………………………………………………

27. දොරටුවෙන් බැටළු ගාලට ඇතුළු නොවී අන් තැනකින් නැඟී පැන එන්නා ජේසුස් වහන්සේ විසින් හඳුන්වා ඇත්තේ කෙසේද?

…………………………………………………………………………………………………………………………

28. එඬේරකු නොවන, බැටළුවන්ගේ අයිතිකාරයා ද නොවන කුලීකාරයා; වෘකයා එන විට කරන්නේ කුමක්ද?

…………………………………………………………………………………………………………………………

29. ජේසුස් වහන්සේ ගෝලයන් සමඟ ලාසරස් මලවුන්ගෙන් උත්ථාන කිරීමට ගිය අවස්ථාවේ දී

“ නිවුන්නා ”යයි නම් ලත් තෝමස් අනෙක් ශ්‍රාවකයන්ට කීවේ කුමක්ද?

…………………………………………………………………………………………………………………………

30. “ඔබ දන්නා දෙයක් නැත. මුළු ජාතියේ විනාශයට වඩා ජනතාව උදෙසා එක මිනිසෙකුගේ මරණය යෝග්‍ය බව ඔබට තේරෙන්නේ නැත”. ජේසුස් වහන්සේ නැසීමට කුමන්ත්‍රණය කළ අවස්ථාවේ දී මෙසේ කීවේ කවිද?

…………………………………………………………………………………………………………………………

31. “ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, දිළින්දෝ නම් ඔබ සමඟ නිතරම සිටිති; එහෙත් මම ඔබ සමඟ නිතරම නොසිටිමි” වදාළ අවස්ථාව කුමක්ද?

…………………………………………………………………………………………………………………………

32. “ මා දිවි ඇති තෙක් කවදාවත් මාගේ පාද සෝදන්නට නම් ඔබ වහන්සේට ඉඩ නොදෙමි” සීමොන් පේදුරු මෙසේ කී විට ජේසුස් වහන්සේ කීවේ කුමක්ද?

…………………………………………………………………………………………………………………………

33. ජොහාන් සුභාරංචියේ 14 වන පරිච්ඡේදයට අනුව; ජේසුස් වහන්සේට ප්‍රේම කරන තැනැත්තා කුමක් කරන්නේද?

…………………………………………………………………………………………………………………………

34. සැබෑ මිදි වැල පිළිබඳ උපමාවේ සඳහන් පරිදි පල දරන සියලු අතු පාහින්නේ ඇයි?

…………………………………………………………………………………………………………………………

35. ජොහන් 17 පරිච්ඡේදයේ, උත්තම පූජක යාච්ඤාවේ සඳහන් පරිදි ශුද්ධ ලියවිල්ල සම්පූර්ණ වන පිණිස විනාශ වුයේ කාවද?

………………………………………………………………………………………………………………

36. ජේසුස් වහන්සේ, "කඩුව කොපුවේ දමන්න, පියාණන් වහන්සේ මට දී තිබෙන කුසලාන මම නොබොම් දැ "යි වදාළේ කාහටද? කුමන අවස්ථාවේදීද?

………………………………………………………………………………………………………………

37. ජේසුස් වහන්සේ කටු ඔටුන්න හිසේ දරා, නීල රක්ත වස්ත්‍රය ද හැඳගෙන පිටතට ආ විට උන්වහන්සේ දෙස බලා පිලාත් කීවේ කුමක්ද?

………………………………………………………………………………………………………………

38. මරියා හඬමින් සොහොන් ගෙය ඇතුළට නැමී බලන විට ඈ දුටු දෙදෙනා කවුරුන්ද? ඔවුන් සොහොන් ගෙයි කුමන ස්ථාන වල හිඳිනු දුටුවෙහිද?

………………………………………………………………………………………………………………

………………………………………………………………………………………………………………

39. ජේසුස් වහන්සේ ගේ මෘත ශරිරය ගෙන ගොස් තැන්පත් කිරීමට පිලාත්ගෙන් අවසර ඉල්ලුවේ කව්ද?

………………………………………………………………………………………………………………

40. උත්ථානවීමෙන් පසු ශ්‍රාවකයන්ට දර්ශනය වු ජේසුස් වහන්සේ ඔරුවේ දකුණු පැත්තෙන් දැළ හෙළන්නැ'යි  පැවසු විට දැලට ලොකු මාලු කී දෙනෙක් අසුවී තිබුණේද?

………………………………………………………………………………………………………………

ප්‍රශ්න අංක 41 – 50 දක්වා කට පාඩම් පද ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න**.**

41. මහලු වියේ ……………………………………………………………… නම් දරුවන්ගේ දරුවෝය. දරුවන්ගේ ……………………………………………………………………… නම් ඔවුන්ගේ පියවරුය.

42. හිතා මතා ක්‍රියාශීලීව වැඩ කරන මිනිසාට ……………………………………………… නියතය. ඉක්මන්කාර මිනිසාට ……………………………………………………………………… සිකුරුය.

Index Number ………………………………………… Marks

43. සමිඳුන්ට ……………………………………………………………………………………… ලෙස ………………………………………………කරන්න. ඔබ ඔප්පු කරන ප්‍රථම පල ගැන ලෝභ නොවන්න.

44. මිතුරුතුමෝ දුක් සැප දෙකෙහිම ……………………………………………………ය;සොහොයුරන් සිටින්නේ ……………………………………………………………………………………දී අත දීමටය.

45. මාගේ පුත්‍රය, විචක්ෂණ බුද්ධිය ද………………………………………………………දියුණු කර ගන්න. ඒවා ඔබ කෙරෙන් පහව යන්නට ඉඩ නොදෙන්න.ඒවා ඔබට …………………………………………… ඔබේ ගෙලට ආභරණයක් ද වනු ඇත.

46. උන් වහන්සේ ………………………………………………………………………පත් කිරීමේ දක්ෂතාව අපට කොහින් සොයා ගත හැකිද? මන්ද මහෝත්තමයාණන් වන උන්වහන්සේ මැවූ සියල්ලට ඉහළින්……………………………………………………………………………………………සේක.

47. සමිඳුන් කෙරෙහි ගරු බිය ඇත්තාට ………………………………………………………………සිදු නොවන්නේය. ඔහුගේ ……………………………………………………ඔහු නැවත නැවත නිදහස් කරනු ලබන්නේය.

48. ප්‍රඥාව නම්. සමිඳුන් හට………………………………………………………………………………පැම වන්නේය……………………………………………………………ඉටු කිරීම ප්‍රඥාවෙහි පිහිටා ඇත්තේය.

49. ………………………………………………………………………………………………යහපත කරන්න. ඔබට ………………………………………ලැබෙන්නේය.ඔහුගෙන් ම නොවේ නම් මහෝත්තමයාණන් වහන්සේගෙන් එය ලැබෙන්නේය.

50. ඉක්මන් ලෙස වැඩ පළෙහි නොයෙදෙන එහෙත් උදව් පතන අයද සිටිති. ඔව්හු ……………………………………………………දුප්පත්ය. දිළිඳුකමින්…………………………………………ය. සමිඳාණන් ඔවුන් දෙස දැඩි ආශාවෙන් බලන සේක.ඔවුන්ගේ දුඃඛිත තත්වයෙන් ඔවුන් ඔසවන සේක.

Index Number …………………………………………. Marks | |